## පැරණි පුවත්පත් මතකයෙන්

# ඇඹිලිපිටියේ සිසු දරු ඝාතනය



දරුවන් ගේ වරද ඔවුන්ගේ ම අනාගතයට අයාපත. එහෙයින් ගුරු දෙගුරුහු ඔවුන් හදා ගන්නට දඬුවම් කරති. දඬුවම් දෙන්නේ දරුවනට ය. රිදෙන්නේ ගුරු දෙගුරු හදවත් වලට ය. දරු සිසු සෙනෙහස නිසා ය. ඊට වැඩි මනත් වරදක් හෝ දඬුවමක් හෝ නොතිබිය යුතු ය.

ඉතින් එක්තරා යුගයක රකුසු රැළක් දරු පිරිසකගේ දිවි තොර කළ බව වැසැංගීමට මළ සිරුරු පවා අතුරුදහන් කළහ. දැවුණු වැළලුණු තැනක් වේ නම් එතැන සිට අද ඒ දරුවන් කතා කරන්නට පටන් ගෙන ඇත. ජීවත් වන්නවුන් ගේ දෙසවන් තුළ මළවුන් ගේ විලාපය රැව් පිළිරැව් දෙමින් මැති, ඇමැති, ගැති පති වරිගයා ගේ මිනිසත්කම යුගයේ විනිශ්චයට ලක් කරනු හොඳටෝ ම හොඳයි.

ඇඹිලිපිටියේ (1989) සිසු දරු ඝාතනය මෙහෙයවූවන් අතර ගුරුවරයකු ද වුනයි සැළවේ. තමන්ගේ ම දරුවන් ඇත ද මූ නම් ගුරු පියෙක් හෝ පිය ගුරෙක් හෝ නම් නොවේ. ගුරු මරුවෙකි. පසුගිය වකවානුවේ අධ්‍යාපනයත් පාසලුත් ගිලගත් දේශපාලනයේ අනිවාර්ය නිෂ්පාදනයක් වූ මේ තිරිසනා සේවයේ සිටීම ගැන අධ්‍යාපන ඇමතිවරුන් අස්විය යුතු නැත. සිය දිවි නසා ගත යුතු ය.

ලොක්කන් ගේ බල්ලකුට කැබලිත්තකින් පහර දුන්නත් බල්ලන් ගේ ලොක්කෝ පළාත ම දෙවනත් කොට "අපරාධකරු" සොයා ගොස් සපා කති. එහෙත් එක් දරුවකු දෙන්නකු නොව තිස් හතළිස් ගණනක අගනා දරු සම්පතක් ලේ පැල්ලමකුදු නොතබා අතුරුදහන් කිරීම ගැන පාලකයන් සසලවීමක් පවා නැත. බොරුවට පරීක්ෂණ පවත්වති. වාර්තා ගොඩ ගසති. මැතිවරණයක් ළඟ එන විට හොරට කර අරිති. නිකං හෙලවෙති. සමහර විට අවසන් කටයුත්ත කළ සොල්දාදුවකු දෙන්නකු පිට වරද පටවා අපිරිසිදු අත් සොදා ගන්නා තැනට වැඩ පිළිවෙල යසට රඟ දක්වනු ඇත.

ඒ එක පැත්තකි. අනික් පැත්තෙන් මෙවන් කුරිරුකම් වලට මඟ පෑදු අමන දේශපාලන කාරකයන් මෙයට වග කිව යුතුය. බිහිසුණු කුරිරුකම් දේශපාලන පරමාර්ථ උදෙසා යොදා ගන්නා විට එහි විපාක හැම අහිංසකයකු වෙත ම ගලා එයි. පොදු ජනයා රැක ගැන්මට මුල සිට ම පුරුද්දක් ලබා නොගන්නා දේශපාලනය පසුව ජනතාව රකිති යි. ඉතිහාසයෙන් ඔප්පු වී නැත. දරුවන් බිල්ලට දී එයින් ඇති වන කම්පනය එක් වාසියක් ලෙස ද, එසේ නොවන අයට මරණ බය ඇති කිරීම අනෙක් වාසියක් ලෙස ද ගන්නා දේශපාලනය අවසානයේ පීඩකයාට ම සේවය කර පීඩකයාට විරුද්ධව නැඟී සිටීමේ ඉඩ කඩ ද වනසා තමා ද වැනසෙයි.

පාසල් සංවර්ධන මණ්ඩල විරෝධයේ වේගයෙන් හෝ වෙනත් කරුණක් නිසා හෝ පාසල් හි බාල බොළඳයන් පෙළඹවීම පීඩකයා ගේ ම මනදොළ සපුරා ගැනීමට උදව්වකි. නැවතත් එවැනි ඝාතන මවුපියන්ට ඇසීමට, දැකීමට මඟ නොපාදන ලෙස විවිධ විදුහල්වල "ලොකු අයියලාට" අපි අවවාද කරමු.

රට පාලනය වන්නේ හදිසි නීතියෙනි. පාලකයන් ගේ පාලකයෝ විදේශ සූරාකන්නෝ ය. උන් ගේත් තමන් ගේත් බලය රැක ගැන්මට ඉතිහාසයේ නොවූ විරූ ඕනෑම ඝාතනයක් උදෙසා තුවක්කු මුදා හැරීමට පාලකයෝ සූදානම් ය. ලේ ගඳ නොගිය අත් පා සුදු රෙදිවලින් වැසූ පමණින් භීෂණයට ඇති හැකියාව නැති නොවේ. හැම පැත්තෙන් ම ඝාතන චරියාව නැති කළ හැකි මහජන බලය වැඩෙන දේශපාලනයක් කාටත් අවශ්‍යවනවා මිස අයුක්තියට එරෙහිවීමට ය කියා කුලප්පුවීම තුවක්කුවට බලය දීමකි.

ළඳරු පාසලක හෝ විශ්ව විද්‍යාලයක හෝ "කුලී වැඩට" යෙදවීමට තවත් මිනී රකුසන් ඕනෑ තරම් සොයා ගත හැකි ය. මවුපියන්ට දරුවන් ද, දරුවන්ට
මවුපියන් ද, අහිමි කරන "ද්වේෂ පාලනයට" ඉඩක් නොදෙන ලෙසට අපි සනිටුහන් කර ගනිමු.

මා පිය දරුවන් ගේ දේශයක් මිස මාපියා මරුවන්ගේ රටක් අපට අවශ්‍ය නැත.

**විවරණ - 1992 දෙසැම්බර්**

